# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2467/77 - 2025 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා - 2025.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනයයි

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1), 14 සහ 20 වන වගන්තියෙන් ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවන ලද පහතින් දැක්වෙන ගැසට් නිවේදනයන්හි සඳහන් රෙගුලාසි පාර්ලිමේන්තුවේ දී යථා පරිදි සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම,**<br>
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන<br>
අමාත්‍යාංශ ලේකම්.

2025 දෙසැම්බර් මස 19 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**පාර්ලිමේන්තුවේදී සම්මත වූ රෙගුලාසි**

1. ශ්‍රී ලංකාවට මෝටර් වාහන ආනයනය සඳහා අවසර දෙමින්, 2025 ජනවාරි මස 31 වැනි දින නිකුත් කරන ලද අංක 2421/44 දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025 මාර්තු මස 20 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව.

2. මෝටර් වාහන ආනයනයට අදාළ අපනයන පරීක්ෂණ සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්, 2025 මාර්තු මස 19 දිනැති අංක 2428/07 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2025 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025 මැයි මස 22 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව.

3. 2013 අප්‍රේල් මස 03 වැනි දිනැති අංක 1804/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2013 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 5 රෙගුලාසියට අනුකූල නොවන ලෙස ආනයනය කර ඇති මෝටර් වාහන කොන්දේසි සහිතව නිදහස් කිරීමට අවසර දෙමින්, 2025 ඔක්තෝබර් මස 24 වැනි දින නිකුත් කරන ලද අංක 2459/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2025 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, 2025 දෙසැම්බර් මස 05 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව.

EOG 12 - 0190

1A - G 45949 — 00 (2025/12)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*